# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය

තැපැල් පෙට්ටිය 452, කොළඹ | කාර්යාලය - 10C, පල්ලිය පාර, ඇල්දෙනිය, කඩවත
www.npassrilanka.org

OPERATIONAL MEMBER (FIAP)

MEMBER (PSA)

WORLD PHOTOGRAPHY CENTER, SRI LANKA (GPU)

# 45 වන ජාතික ඡායාරූප ප්‍රදර්ශනය හා තරගය 2024

2024-L-046

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, සිය 45 වන ජාතික ඡායාරූප ප්‍රදර්ශනය හා තරගය සඳහා කෘතීන් ඉදිරිපත් කරන ලෙසට දිවයිනේ ඡායාරූප ශිල්පීන් (ආධුනික සහ වෘත්තීයීය) වෙත ආරාධනය කර සිටී.

## ප්‍රදර්ශන/තරග කාල රාමුව

| | |
|---|---|
| කෘතීන් භාරගැනීමේ අවසන් දිනය | 2024 මැයි 31 |
| ආමක දත්ත ගොනු (Raw Files) ලබා ගැනීම | 2024 ජූනි 01 සිට 2024 ජූනි 7 දක්වා |
| කෘතීන් විනිශ්චය | 2024 ජූනි 8 |
| ප්‍රතිඵල නිවේදන යැවීම | 2024 ජූනි 23 |
| තිළිණ ප්‍රදානොත්සවය | 2024 ජූලි 13 |
| ප්‍රදර්ශණය | 2024 ජූලි 13 සහ 14 |

# ඇතුලත්වීමේ කොන්දේසි

## තරග අංශ
සෑම අයදුම්කරුවෙකුටම පහත දැක්වෙන තරග අංශවලින් අංශ පහකට, එක් අංශයකට උපරිම වශයෙන් හතරක් බැගින් වන පරිදි කෘතීන් ඉදිරිපත් කළ හැකි ය. මෙහි පහත මුළින් දක්වා ඇති (1 සිට 4 දක්වා) අංශ හතරෙන් අංක 1 සහ 2 ට හෝ 3 සහ 4 ට පමණක් ඔවුන් සිය කෘතීන් ඉදිරිපත් කළ යුතු ය. අනෙකුත් අංශ (5, 6 සහ 7) සඳහා එවැනි සීමා කිරීමක් නැත.

1. ආධුනික වර්ණ
2. ආධුනික ඒකවර්ණ
3. විවෘත වර්ණ
4. විවෘත ඒකවර්ණ
5. සංචරණ (විවෘත)
6. සොබාදහම් හා වන ජීවී (විවෘත)
7. ජංගම දුරකථන ඡායාරූප (විවෘත)

එක් ඡායාරූපයක් ඉදිරිපත් කළ හැක්කේ එක් තරග අංශයකට පමණකි. මීට පෙර ප්‍රදර්ශනය වූ ඡායාරූප (ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ කළින් පවත්වන ලද ප්‍රදර්ශනවල) හෝ ඒවාට සමාන කෘතීන් මෙම තරගයේ දී විනිශ්චයන් ලබාදීම සඳහා ඉදිරිපත් නොකෙරේ. වර්ණ අංශ සඳහා ඒකවර්ණ ඡායාරූප හෝ ඒකවර්ණ අංශ සඳහා වර්ණ ඡායාරූප හෝ ඉදිරිපත් කර තිබුනහොත් එම කෘතීන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## ප්‍රකාශන හිමිකම්
සියළුම කෘතීන්වල මුල් නිර්මාණ, ඡායාරූපමය ක්‍රියාදාමයන් ඔස්සේ ලබාගත් ඒවා විය යුතු අතර, තමන් ඉදිරිපත් කරනු ලබන කෘතීන්හි සමස්ත ප්‍රකාශන හිමිකම අයදුම්කරු සතු විය යුතු ය. පසුරු චිත්‍ර (Clip Arts) සහ ප්‍රකාශන හිමිකම් රහිත නර්මාණ මේ සඳහා භාරගනු නොලැබේ. අයදුම්කරුවන්ගේ ප්‍රසිද්ධ කරනු ලබන ඡායාරූපවල ප්‍රකාශන හිමිකම් සම්බන්ධයෙන් උද්ගත වන නෛතික ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය කිසිදු වගකීමක් නොදරන බව ද සැළකිය යුතු ය.

## මාතෘකා යෙදීම
කෘතීන් සඳහා යොදනු ලබන මාතෘකාවල ප්‍රමාණය, හිස්තැන් ද සමග අක්ෂර 25 කට නොවැඩි විය යුතු ය. සෑම කෘතියකටම ඊට අනන්‍ය වූ මාතෘකාවක් තබි ය යුතු වේ. “මාතෘකා රහිත” හෝ “මාතෘකාවක් නැත” ලෙස නම් කර ඇති කෘතීන් භාර ගනු නොලැබේ. සොබාදහම් අංශයට ඉදිරිපත් කරනු ලබන කෘතීන් වලට මාතෘකා යෙදීමේ දී හුදු චිත්තාකර්ශනය නාමයන් නොව වස්තු විෂයය නිසි ආකාරයෙන් හඳුනාගත හැකි අන්දමේ ව්‍යක්ත මාතෘකාවන් යෙදිය යුතු ය. එවැනි පිළිගත හැකි අන්දමේ මාතෘකා රහිත කෘතීන් විනිශ්චය සඳහා ඉදිරිපත් නොකෙරේ.

## ගොනු නාමකරණය
ඡායාරූප ගොනු මෙහි පහත දැක්වෙන අන්දමට යළි නාමකරණය කොට ඉදිරිපත් කළ යුතු ය.

| |
|---|
| තරග අංශය-අයදුම්කරුගේ නම-කෘතියේ මාතෘකාව.jpg |

**උදාහරණ -** තරග අංශය : විවෘත වර්ණ / අයදුම්කරුගේ නම: පසන් සිල්වා / කෘතියේ මාතෘකාව : Fate.jpg නම්, නාමකරණය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| |
|---|
| Open Colour-Pasan Silva-Fate.jpg |

කෘතීන්හි මාතෘකා සහ අයදුම්කරුවන්ගේ නම් ඇතුලත්වීමේ පෝරමයේ සඳහන් කළ යුත්තේ ප්‍රදර්ශන නාමාවලියේ ඒවා සඳහන් විය යුතු ආකාරයට ය.

## නම් සහ දිය සළකුණු
කෘතීන් විනිශ්චයේ දී අයදුම්කරු පිළිබඳ තොරතුරු කිසිවක් තේරීම් කමිටුවට ලබා දෙන්නේ නැත. යම්හෙයකින් එවැනි විස්තර දිය සළකුණු හෝ වෙනත් ආකාරයකින් අදාල කෘතිය සමග දැක්වෙන්නේ නම් එවැනි කෘතීන් තරගයෙන් ඉවත් කරනු ලැබේ.

## පිළිබිඹුවේ ප්‍රමාණය
සියළුම ඡායාරූප JPEG ගොනු ආකෘතිය යටතේ ඉදිරිපත් කළ යුතු ය. රූපයේ විභේදනය 300ppi ද, මායිම් තීර (borders) ද ඇතුළුව, තිරස් දිශාවට උපරිම පික්සල් ප්‍රමාණය 1920 ක් ද, සිරස් දිශාවට එය 1080 ක්ද විය යුතු ය. ගතරු (Portrait) හෙවත් සිරස් ප්‍රකාරයේ ඡායාරූපවල සිරස් දිශාවට උපරිම පික්සල් ප්‍රමාණය 1080 නො ඉක්මවිය යුතු ය. මෙම සීමාවන්ට වඩා කුඩා ප්‍රමාණයේ ඡායාරූප භාරගන්නා අතර, කෙසේ වුවද ප්‍රදර්ශන තිරය මත ඒවා කුඩා ප්‍රමාණයෙන් ප්‍රක්ෂේපණය කෙරෙනු ඇත. රූප ගොනුවක ප්‍රමාණය මෙගා බයිට් 2 (2 MB) නො ඉක්මවිය යුතු වේ. රූප ප්‍රක්ෂේපණය කිරීමේ දී පසුබිම් වර්ණය වන්නේ කළු පැහැය යි. හිස් ඉඩ ප්‍රමාණයන් පිරවීම හෝ විශාල මායිම් තීර යෙදීම නොකළ යුතු ය. මායිම් තීරයක පළල පික්සල් 2 කට නොවැඩි විය යුතු අතර එය පික්සල් 1920 ද 1080 ප්‍රමාණයේ රූප රාමුව තුළම අඩංගු විය යුතු ය.

ජංගම දුරකථන ඡායාරූප අංශයට කෘතීන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් තම ඡායාරූපවල මූලික දත්ත (Meta Data) සුරැකෙන පරිදි ඒවා ඉදිරිපත් කළ යුතු වේ.

## වර්ණ අවකාශය
ප්‍රදර්ශන හා විනිශ්චය කිරීමේ මෘදුකාංග ක්‍රියාත්මක වන්නේ sRGB වර්ණ අවකාශය තුළ වන අතර රූප ප්‍රක්ෂේපණය කරනු ලබන්නේ එම වර්ණ අවකාශය පදනම් කර ගනිමිනි. ඒ අනුව ප්‍රක්ෂේපණ උපාංගවලින් පෙන්වනු ලබන්නේ එම අවකාශය තුළ දර්ශනය වන වර්ණ පමණි.

## ගූගල් පෝරමය මගින් කෘතීන් ඉදිරිපත් කිරීම
නිසි ආකාරයෙන් යළි නාමකරණය කරන ලද රූප ගොනු ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ www.npassrilanka.org වෙබ් අඩවිය ඔස්සේ ගූගල් පෝරමය මගින් එවිය යුතු ය.

## කොන්දේසි කෙරෙහි අනුකූලතාවය
මෙම තරගය සහ ප්‍රදර්ශනය පැවැත්වීමට පෙර, පවත්වන අතර හෝ ඉන් පසුව, කිසියම් කෘතියක් හෝ ඇතුලත්වීමේ අයදුම්පතක්, කිසියම් හේතුවක් නිසා අවශ්‍ය වන්නේ නම් තම අභිමතය පරිදි තරගයෙන් ඉවත් කිරීමට සංවිධායකයින් කටයුතු කරනු ඇත. යම් කෘතයි ක් හෝ ඇතුලත්වීමේ අයදුම්පතක් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන්නේ ඒවා තරග කොන්දේසි සහ අර්ථ නිරූපනවලට (මෙහි පහත සඳහන් වන) පටහැනි වන්නේ නම් හෝ තරගය සඳහා එම කෘතීන් හෝ ඇතුලත්වීමේ අයදුම්පත නසුදුසු බව පෙනී ගියහොත් ය. ඉදිරිපත් කර ඇති කෘතීන් තරග කොන්දේසි හා අර්ථ නිරූපනවලට අනුකූල වන්නේ ද යන්න සනාථ කර ගැනීම සඳහා, සංවිධායකයින් විසින්,

1. අදාල කෘතීන් අයදුම්කරුගේම නිර්මාණයන් ද යන බව, සහ
2. ඇතුලත්වීමේ කොන්දේසි සහ අර්ථ නිරූපනවලට එම කෘතීන් අනකූල වන්නේ ද යන බව,

නිර්ණය කර ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂාවන් සිදු කරනු ඇත.

මෙහි දී එම කෘතීන්වල මුල් පිටපත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුගෙන් ඉල්ලා සිටිනු ඇත. යම්හෙයකින් ඉදිරිපත් කර ඇති කෘතීන් ඇතුලත්වීමේ කොන්දේසිවලට හෝ අර්ථ නිරූපනවලට පටහැනි වන්නේ නම් හෝ, ඒවා අයදුම්කරුගේම නිර්මාණ නොවන බව සනාථ වන්නේ නම් හෝ අයදුම්කරුගේ සමස්ත ප්‍රවේශනයම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක. එසේ මුල් පිටපත් ඉල්ලා සිටි අවස්ථාවක දී, ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවෙකු වෙතොත්, සංවිධායකයින්ගේ අභිමතය පරිදි, ඔහු/ඇය තරග කොන්දේසි කඩ කළ අයෙකු ලෙස සළකා එයින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබිය හැක.

කිසියම් අයදුම්පතක් සහ ඒ සමග ඉදිරිපත් කර ඇති කෘතීන් භාර ගන්නේ ද යන බවට ගනු ලබන සංවිධායකයින්ගේ සහ විනිසුරු මඩුල්ලේ තීරණය අවසාන තීරණය සේ සැළකෙනු ඇත. තරග කොන්දේසි කඩ කිරීම් සහ ඒ සම්බන්ධ නිරීක්ෂණයන් අදාල නියාමන ආයතන වෙත වාර්තා කිරීමට කටයුතු කරන අතර, ඒ අනුව එම අයදුම්කරුවන්ට ඉදිරියේ දී වෙනත් ප්‍රදර්ශන හා තරගවලට සහභාගිවීමේ අවස්ථාවන් නොලැබී යාමට ඉඩ ඇත.

## කෘතීන්වල අයෝග්‍යතාවට අදාල ප්‍රතිමාන

- ඒකවර්ණ ඡායාරූප, ආධුනික වර්ණ හෝ විවෘත වර්ණ අංශ සඳහා භාර නොගනු ඇත.
- වර්ණ ඡායාරූප, ආධුනික ඒකවර්ණ හෝ විවෘත ඒකවර්ණ අංශ සඳහා භාර නොගනු ඇත.
- කිසියම් තරග අංශයක් සඳහා දී ඇති නිර්වචනයන් හා සමග නොගැලපෙන කෘතීන් නුසුදුසු බවට පත් වනු ඇත.

## ප්‍රතිඵල නිවේදනය කිරීම

ප්‍රතිඵල නිවේදන විද්‍යුත් තැපෑල මගින් පමණක් සිදු කරනු ඇත. අයදුම්කරුවන් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින විද්‍යුත් තැපැල් ලිපින ලබාදීමට සැළකිලිමත් විය යුතු අතර, npasexhibitions@gmail.com ලිපිනයෙන් ලැබෙන පණිවුඩ ප්‍රතික්ෂේපිත කාණ්ඩයට නොයන පරිදි තම විද්‍යුත් තැපැල් පරිස්ථිතීන් සකස් කොට තැබීමට ද කටයුතු කිරීම අවශ්‍ය ය. සන්නිවේදන කාර්‍යයන් කිසිවක් තැපැල් මගින් සිදු නොකෙරේ.

## ප්‍රදර්ශන නාමාවලිය

අයදුම්කරුවන්ට ප්‍රදර්ශන නාමාවලියේ PDF පිටපතක්, 2024 ජූලි 13 දිනෙන් පසුව, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ වෙබ් අඩවියෙන් http://npassrilanka.org සබැඳිය ඔස්සේ බාගත කර ගත හැක.

## කෘතීන් ප්‍රතිනිෂ්පාදනය

මෙම 45 වන ජාතික ඡායාරූප ප්‍රදර්ශනය තරගය සඳහා කෘතීන් ඉදිරිපත් කිරීම මගින්, ප්‍රදර්ශන නාමාවලියේ හෝ අන්තර්ජාලයේ පලකිරීම සහ/හෝ ප්‍රදර්ශනයට සම්බන්ධ වෙනත් මාධ්‍ය අවශ්‍යතාවයන් සඳහා සිය කෘතීන් කොටස් හෝ සම්පූර්ණ වශයෙන් ප්‍රතිනිෂ්පාදනය කිරීමේ අවසරය, සංවිධායකයින් වෙත ලබා දී ඇති බව සළකනු ලැබේ.

## තිළිණ

| තරග අංශය | NPAS<br>ස්වර්ණ මුද්‍රිකාව | NPAS<br>රජත මුද්‍රිකාව | NPAS<br>ලොකඩ මුද්‍රිකාව | NPAS<br>කුසලතා තිළිණ |
|---|---|---|---|---|
| ආධුනික වර්ණ | 1 | 1 | 1 | 8 |
| ආධුනික ඒකවර්ණ | 1 | 1 | 1 | 8 |
| විවෘත වර්ණ | 1 | 1 | 1 | 8 |
| විවෘත ඒකවර්ණ | 1 | 1 | 1 | 8 |
| සංචරණ (විවෘත) | 1 | 1 | 1 | 8 |
| සොබාදහම් සහ වනජීවී (විවෘත) | 1 | 1 | 1 | 8 |
| ජංගම දුරකථන ඡායාරූප (විවෘත) | 1 | 1 | 1 | 5 |
| තරගයේ හොඳම ඒකවර්ණ ආලේඛ්‍ය ඡායාරූපය සඳහා පිරිනැමෙන එල්. ඊ. සමරරත්න අභියෝග තිළිණය | | | | |
| තරගයේ හොඳම ඡායාරූප ශිල්පියා වෙත පිරිනැමෙන හෙන්රි රාජකරුණා අභියෝග තිළිණය | | | | |

## විනිශ්චය මණ්ඩලය

| | |
|---|---|
| ආධුනික වර්ණ /<br>ආධුනික ඒකවර්ණ | සංඛ සම්මාන මහතා<br>*EFIAP,GPU CR 2,GPU Aphrodite, LPSS, GAPU, FNAPSL, ANPAS,AISLP, Creative PHOTO-ARTIST*<br>ගගන් කරුණාචන්ද්‍ර මහතා<br>*AFIAP, ANPAS*<br>අශේන් මාරසිංහ මහතා<br>*EFIAP/b, GPU-CR02, cMOL* |
| විවෘත වර්ණ /<br>විවෘත ඒකවර්ණ | සංඛ සම්මාන මහතා<br>*EFIAP,GPU CR 2,GPU Aphrodite, LPSS, GAPU, FNAPSL, ANPAS,AISLP, Creative PHOTO-ARTIST*<br>මිත්‍ර එස්. වීරකෝන් මහතා<br>*Hon. FNPAS, ANPAS, LISLP*<br>අතුල රණරාජා මහතා<br>*Dip. in Photography-NPAS, Dip. in Photography-Uni. of Kelaniya, Hon. FNPAS, LISLP* |
| සංචරණ (විවෘත) /<br>ජංගම දුරකථන (විවෘත) | සංඛ සම්මාන මහතා<br>*EFIAP,GPU CR 2,GPU Aphrodite, LPSS, GAPU, FNAPSL, ANPAS,AISLP, Creative PHOTO-ARTIST*<br>අතුල රණරාජා මහතා<br>*Dip. in Photography-NPAS, Dip. in Photography-Uni. of Kelaniya, Hon. FNPAS, LISLP*<br>ප්‍රියන්ත බණ්ඩාර මහතා<br>*Professional Landscape, Architectural & Commercial Photographer / Instructor* |
| සොබාදහම් සහ වනජීවී (විවෘත) | වෛද්‍ය ලලිත් ඒකනායක මහතා<br>*EFIAP*<br>ලක්සිත කරුණාරත්න මහතා<br>*FRPS*<br>අශේන් මාරසිංහ මහතා<br>*EFIAP/b, GPU-CR02, cMOL* |

## ඒකවර්ණ ඡායාරූප - නිර්වචනය

තද කළු පැහැයේ සිට තද සුදු පැහැය දක්වා වන විවිධාකාරයේ අතරමැදි අළු පැහැයයන්ගෙන් සමන්විත වන කළු-සුදු ඡායාරූප ඒකවර්ණ ඡායාරූප ලෙස නර්වචනය කෙරේ. කිසියම් එක් වර්ණයකින් පමණක් පැහැ ගන්වන ලද (Toned) කළු-සුදු ඡායාරූපයක් ද ඒකවර්ණ ඡායාරූපයක් ලෙස සැළකේ. එවැන්නක් ප්‍රදර්ශන නාමාවලියක මුද්‍රණය කිරීම සඳහා කළු-සුදු පැහැයෙන් ප්‍රතිනිෂ්පාදනය කළ හැකි වේ. අනෙක් අතට, යම් වර්ණයක් එක් කිරීමෙන් කොටසක් පමණක් පැහැගන්වන ලද කළු-සුදු ඡායාරූපයක් වර්ණ ඡායාරූපයක් (බහුවර්ණ) ලෙස සැළකෙන අතර එවැන්නක් ප්‍රදර්ශන නාමාවලියක මුද්‍රණය කිරීම සඳහා වර්ණ ප්‍රතිනිෂ්පාදන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට සිදු වේ.

## *Monochrome Definitions*

A black and white work fitting from the very dark grey (black) to the very clear grey (white) is a Monochrome work with the various shades of grey. A black and white work toned entirely in a single colour will remain a Monochrome work able to stand in the black and white category; such a work can be reproduced in black and white in the catalogue of a salon under FIAP Patronage. On the other hand a black and white work modified by a partial toning or by the addition of one colour becomes a colour work (polychrome) to stand in the colour category; such a work requires colour reproduction in the catalogue of a salon under FIAP Patronage.

## සොබාදහම් ඡායාරූප - නිර්වචනය

විවිධ කරුණු පිළිබඳව දැනුමෙන් සපිරි අයෙකුට අදාල වස්තු විෂයය හොඳින් හඳුනාගත හැකි ආකාරයට, මානව විද්‍යාත්මක හා පුරා විද්‍යාත්මක අංශ හැර, ස්වභාවික පැවැත්මේ අන් සියළුම ක්ෂේත්‍රයන්ට අදාල තොරතුරු ඡායාරූප මාධ්‍යය ඔස්සේ සත්‍ය ලෙස ඉදිරිපත් කෙරෙන කෘතීන් සොබාදහම් ඡායාරූප ගණයට ඇතුල ත් වේ. සොබාදහම් ඡායාරූප, උසස් තාක්ෂණික ගුණාත්වයක් රඳවා ගනිමින්, කෘතියේ සචිත්‍රමය ලක්ෂණයන්ට වඩා වෘත්තාන්තමය ප්‍රකාශන අගය ඉස්මතු කොට දැක්වෙන නිර්මාණ විය යුතු ය. කිසියම් සොබාදහම් වස්තු විෂයයක් හා සමග සංඝටනීය ලෙස බද්ධව පවතින්නේ නම් හැර, මානව රූප එවැනි ඡායාරූපවල අඩංගු නොවිය යුතු ය. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවය වෙනස් වූ පරිසර පද්ධතිවල වෙසෙන බකමුහුණු සහ කොකුන් ආදි සතුන්ගේ චර්යාවන්, සුළි සුලං හා මුහුදු රල උදම් වැනි ස්වභාවික සංසිද්ධීන්, නිරූපනය කෙරෙන ඡායාරූප ද, සොබාදහම් ගණයට අයත් ලෙස සැළකේ. සත්ත්ව විද්‍යාත්මක අවශ්‍යතාවයන් උදෙසා ගෙලෙහි විවිධ උපාංග පළඳවා ඇති වන සතුන් දැක්වෙන ඡායාරූප ද ඊට අයත් වේ. එහෙත් මිනිසා විසින් නර්මිත දෙමුහුන් ශාඛ, වගාකරන ලද ශාඛ, මිනිසා විසින් හීලෑ කොට පසුව වනගත වූ සතුන්, ගෘහාශ්‍රිත සතුන් ආදිය දැක්වෙන ඡායාරූප ඒ සඳහා ඉදිරිපත් කළ නොහැක.

කොටස් කපා හැරීම (Cropping) හැර, සොබාදහම් අංශයට ඉදිරිපත් කරන ඡායාරූපයකට බාහිර අරමුණු එක්කිරීම, පවතින අරමුණු යළි ස්ථානගත කිරීම, ඉවත් කිරීම ආදි කිසිදු සංස්කරණයක් නොකළ යුතු ය. ඡායාරූපයක විචිත්‍රමය ස්වභාවයට සහ එහි අන්තර්ගතයට බලපෑමක් ඇති නොවන ආකාරයට එහි ප්‍රකාශනාත්මක හා තාක්ෂණික ගුණය වැඩි කිරීම සඳහා සිදු කරනු ලබන දවාහැරීම සහ ආවරණය (Burning and Dodging), නාභි ආකලනය (Focus Stacking), අධි ගතික පරාස පරිනාමනය (HDR Transformation) ආදි ශිල්පක්‍රම භාවිතය අනුමත කෙරේ. දුහුවිලි ලප, රූප ඝෝෂාව (Noise), පටලයේ සීරීම් ආදි දොස් සමනය කිරීම සඳහා සිදුකරනු ලබන සංස්කරණයන් ද එලෙස ඉඩ දිය හැකි කාර්‍යයන් වේ. එවැනි ඉඩ දී ඇති සංස්කරණයන් රූපවල ස්වාභාවික පෙනුම පවතින ආකාරයට සිදු කළ යුතු ය. වර්ණ ඡායාරූප, ඒකවර්ණ ඡායාරූප ලෙස පරිනාමනය කිරීමට ඉඩ දිය හැක. සෘජුවම ඡායාරූප ගත කළ හෝ ව්‍යුත්පන්න කළ අධෝරක්ත ඡායාරූප සොබාදහම් අංශයට භාර ගන්නේ නැත.

සොබාදහම් තරග අංශවලට ඉදිරිපත් වන ඡායාරූප සොබාදහම් සහ වනජීවී යනුවෙන් ප්‍රභේදයන් දෙකකට වෙන්කර දැක්විය හැකි ය. ඉහත දක්වා ඇති නිර්වචනයන්ට අනුකූලව සොබාදහම් අංශයට අදාල ඡායාරූපවලට භූමි දර්ශන, භූ විද්‍යාත්මක සංස්ථානයන්, කාලගුණික සංසිද්ධි සහ පවත්නා ජීවී විශේෂ ආදිය, ප්‍රමුඛ අරමුණු ලෙස ඇතුලත් කළ හැක. සත්වෝද්‍යාන, දඩබිම්, උද්භිද උද්‍යාන, ජලජීවී තටාක සහ තම පැවැත්ම මුළුමණින්ම මානවයා මත රඳා පවතින පරිසර පද්ධති ආදි පාලනය කළ තත්ත්වයන් යටතේ පවතින ස්ථානවල ඇති අරමුණු ද ඊට අයත් වේ.

## *Nature Definition*

Nature photography is restricted to the use of the photographic process to depict all branches of natural history, except anthropology and archaeology, in such a fashion that a well-informed person will be able to identify the subject material and certify its honest presentation. The story telling value of a photograph must be weighed more than the pictorial quality while maintaining high technical quality. Human elements shall not be present, except where those human elements are integral parts of the nature story such as nature subjects, like barn owls or storks, adapted to an environment modified by humans, or where those human elements are in situations depicting natural forces, like hurricanes or tidal waves. Scientific bands, scientific tags or radio collars on wild animals are permissible. Photographs of human created hybrid plants, cultivated plants, feral animals, domestic animals, or mounted specimens are ineligible, as is any form of manipulation that alters the truth of the photographic statement.

No techniques that add, relocate, replace, or remove pictorial elements except by cropping are permitted. Techniques that enhance the presentation of the photograph without changing the nature story or the pictorial content, or without altering the content of the original scene, are permitted including HDR, focus stacking and dodging/burning. Techniques that remove elements added by the camera, such as dust spots, digital noise, and film scratches, are allowed. Stitched images are not permitted. All allowed adjustments must appear natural. Color images can be converted to grey-scale monochrome. Infrared images, either direct-captures or derivations, are not allowed.

Images used in Nature Photography competitions may be divided in two classes: Nature and Wildlife. Images entered in Nature sections meeting the Nature Photography Definition above can have landscapes, geologic formations, weather phenomena, and extant organisms as the primary subject matter. This includes images taken with the subjects in controlled conditions, such as zoos, game farms, botanical gardens, aquariums and any enclosure where the subjects are totally dependent on man for food.

## සංචරණ ඡායාරූප - නිර්වචනය

සංචරණ ඡායාරූප යනු කිසියම් භූමි ප්‍රදේශයක ස්වාභාවික වශයෙන්ම පවතින චරිත ලක්ෂණ හුවා දැක්වෙන ඡායාරූපමය කෘතීන් වේ. ඒවාට භූගෝලීය සීමාවන් නොමැත. හුදෙක් ඡායාරූප නිර්මාණය කිරීමේ අපේක්ෂාව ඇතිව සංවිධානය කරනු ලබන සංසිද්ධීන් තුළින් ලබා ගන්නා ඡායාරූප හෝ, එම කාර්‍යයන් සඳහාම යොදවාගන්නා පුද්ගලයන් හෝ අරමුණු ඇතුලත් ඡායාරූප මෙයට ඇතුල ත් නොවේ. පුද්ගලයින්ගේ හෝ අරමුණුවල සමීප රූපවලට පිහිටි පරිසරය පිළිබඳව තොරතුරු දැක්වෙන චරිතාංගයන් ඇතුලත් වීම අවශ්‍ය වේ.

කොටස් කපා හැරීම (Cropping) හැර, ඡායාරූපයකට බාහිර අරමුණු එක්කිරීම, පවතින අරමුණු යළි ස්ථානගත කිරීම, ඉවත් කිරීම ආදි සංස්කරණයන් අනුමත නොකෙරේ. දුහුවිලි ලප, රූප ඝෝෂාව, පටලයේ සීරීම් ආදි දෝෂ සමනය කිරීම සඳහා සිදුකරනු ලබන සංස්කරණයන්, මුල් දර්ශනයේ පෙනුම ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ සම්පූර්ණ වශයෙන් ඒකවර්ණ

ලෙස පරිනාමනය කිරීම පමණක් ඉඩ දිය හැකි කායයීයන් වේ. අධෝරක්ත පරිනාමනය ඇතුළු වෙනත් ව්‍යුත්පන්න කිරීම් අනුමත නොකෙරේ. සියළුම රූපවල ස්වාභාවික පෙනුම පැවතිය යුතු ය.

## *Photo Travel Definition*

A Photo Travel image expresses the characteristic features or culture of a land as they are found naturally. There are no geographical limitations. Images from events or activities arranged specifically for photography, or of subjects directed or hired for photography are not appropriate, close up pictures of people or objects must include features that provide information about the environment.

Techniques that add, relocate, replace or remove any element of the original image, except by cropping, are not permitted. The only allowable adjustments are removal of dust or digital noise, restoration of the appearance of the original scene, and complete conversion to grayscale monochrome. Other derivations, including infrared, are not permitted. All images must look natural.

## කෘතිම බුද්ධිය භාවිතය

කෘතිම බුද්ධිය භාවිත කොට නිර්මාණය කරන ලද කෘතීන් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සමස්ත තරගයෙන් ම ඉවත් කෙරෙනු ඇත.

## ආමක ගොනු (RAW Files)

සොබාදහම් හා වනජීවී (විවෘත) සහ සංචරණ (විවෘත) අංශවලට කෘතීන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් 2024 ජුනි මස 14 දිනට පෙර “WeTtransfer” හෝ “Google Drive” ක්‍රමවේද ඔස්සේ npasexhibitions@gmail.com යන විද්‍යුත් ලිපිනයට තම කෘතීන්වල ආමක ගොනු (Raw Files) එවිය යුතු ය. එසේ ආමක ගොනු එවීමට අපොහොසත් වන අයදුම්කරුවන් තරගයෙන් ඉවත් කරනු ලැබේ.

## ඇතුලත්වීමේ ගාස්තු

| ආධුනික අංශ | |
|---|---|
| ඕනෑම ආධුනික අංශයක් සඳහා | රු 400/- |

★ ආධුනික අංශවලට කෘතීන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් තම අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරන ලද හැඳුනුම්පතෙහි / සාමාජික කාඩ් පතෙහි පිටපතක්, ගූගල් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය. පාසැල් අයදුම්කරුවන් පන්තිභාර ගුරුවරයා/ගුරුවරිය විසින් පාසැල් මුද්‍රාව සහිතව නිකුත් කරන ලද සහතික කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු වේ.

★ සෑම පාසැලකටම තම සිසුන්ගේ කෘතීන්, සමූහ වශයෙන් ඉදිරිපත් කළ හැක. එම සමූහ ඉදිරිපත් කිරීම්, මේ පිළිබඳව කායයී භාර ගුරුවරයා/ගුරුවරියගේ සහතකි කිරීමේ ලිපියක් ද සමග “WeTransfer” හෝ “Google Drive” ක්‍රමවේද ඔස්සේ npasexhibitions@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතු ය. කෘතීන් විනිශ්චය කිරීම වෙන් වෙන් වශයෙන් සිදු කරනු ලැබේ.

| විවෘත අංශ | |
|---|---|
| ඕනෑම විවෘත අංශයක් සඳහා | රු 500/- |

## ගෙවීම් සිදු කිරීම
ඇතුලත්වීමේ ගාස්තු පහත විස්තර දැක්වෙන බැංකු ගිනුමට ගෙවිය යුතු ය.

| | | |
|---|---|---|
| ගිනුමේ වර්ගය | : | ජංගම ගිනුම |
| ගිනුම් අංකය | : | 000460002133 |
| ගිනුමේ නම | : | ද නැෂනල් ෆොටෝග්‍රැෆික් ආර්ට් සොසයටි ඔෆ් ශ්‍රී ලංකා |
| බැංකුවේ නම | : | සම්පත් බැංකුව පී එල් සී |
| ශාඛාව | : | බොරැල්ල, කොළඹ 8 |

| | |
|---|---|
| Account Type | Currant Account |
| Account No. | 000460002133 |
| Account Name | The National Photographic Art Society of Sri Lanka |
| Bank | Sampath Bank PLC. |
| Branch | Borella, Colombo 08. |

මුදල් ගෙවීම් පෝරමයේ අයදුම්කරුගේ නම (ඇතුලත් වීමේ පෝරමයේ දැක්වෙන පරිදි) සහ ගෙවීම් සිදු කිරීමේ හේතුව ලෙස "45 වන ඡායාරූප ප්‍රදර්ශනයේ ඇතුලත් වීමේ ගාස්තු" යනුවෙන් ද සඳහන් කර තිබීම අත්‍යවශ්‍ය ය. ඇතුලත් වීමේ ගාස්තු නොගෙවා ඉදිරිපත් කරනු ලබන කෘතීන් විනිශ්චය සඳහා ඉදිරිපත් නොකරන බව සංවිධායකයින් කණගාටුවෙන් දන්වා සිටී. මෙම ප්‍රදර්ශනය සහ තරගය සඳහා කෘතීන් ඉදිරිපත් කිරීම, මෙහි සඳහන් සියළුම නීති සහ කොන්දේසිවලට එකඟ වීමක් ලෙස සැළකේ.

## විමසීම්
යම් කරුණක් පිළිබඳව විමසීම් කිරීමට අවශ්‍ය අයෙකුට ඒවා npasexhibitions@gmail.com ලිපිනයට විද්‍යුත් තැපැල් මගින් ඉදිරිපත් කළ හැක.

## ඉතා වැදගත්
සන්නිවේදන කායයීයන් කිසිවක් තැපැල් මගින් සිදු නොකෙරෙන අතර විද්‍යුත් තැපෑල මගින් පමණක් සිදු කෙරේ. අයදුම්කරුවන් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින විද්‍යුත් තැපැල් ලිපින ලබාදීමට සැළකිලිමත් විය යුතු අතර, npasexhibitions@gmail.com ලිපිනයෙන් ලැබෙන පණිවුඩ ප්‍රතික්ෂේපිත කාණ්ඩයට නොයන පරිදි තම විද්‍යුත් තැපැල් පරිස්ථිතීන් සකස් කොට තැබීමට කටයුතු කිරීම ද අවශ්‍ය ය.

---


සමීර කොතලාවල
EFIAP, ANPAS
ප්‍රදර්ශණ අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැපැල් පෙට්ටිය 452, කොළඹ
කාර්යාලය - 10C පල්ලිය පාර, ඇල්දෙනිය, කඩවත
0772 55 55 54
www.npassrilanka.org

THE NATIONAL PHOTOGRAPHIC ART SOCIETY OF SRI LANKA

P.O Box 452, Colombo, Sri Lanka | Office : 10C, Church Road, Eldeniya, Kadawatha, Sri Lanka

www.npassrilanka.org

OPERATIONAL MEMBER (FIAP)

MEMBER (PSA)

WORLD PHOTOGRAPHY CENTER, SRI LANKA (GPU)

# 45th National Competition and Exhibition of Photography 2024

2024-L-046

The National Photographic Art Society of Sri Lanka is pleased to invite photographers (Amateur and Professional) from all over the Country to participate in their 45th National Competition and Exhibition of Photography 2024 - Sri Lanka.

## CALENDAR

| | |
|---|---|
| Entries Closing Date | 31st May 2024 |
| Raw File Collection | 1st June to 7th June 2024 |
| Judging | 8th June 2024 |
| Notifications Sent | 23rd June 2024 |
| Award Ceremony | 13th July 2024 |
| Exhibition | 13th & 14th July 2024 |

# ENTRY CONDITIONS

## SECTIONS
Each entrant can submit a maximum of 4 images in each of the following sections. Out of the first four sections mentioned here (1 to 4), an entrant can submit photographs, either for 1 and 2 or 3 and 4 only. There is no such limitation for sections 5, 6 and 7.

1. AMATEUR COLOUR
2. AMATEUR MONOCHROME
3. OPEN COLOUR
4. OPEN MONOCHROME
5. TRAVEL (OPEN)
6. NATURE & WILDLIFE (OPEN)
7. MOBILE PHONE PHOTOGRAPHY(OPEN)

**THE SAME IMAGE MUST NOT BE SUBMITTED IN MORE THAN ONE SECTION.**
Previous Acceptances, (Images accepted in previous Exhibitions of the National Photographic Art Society of Sri Lanka) or similar works to those accepted, will not be submitted for judging. Submission of Monochrome photographs to the Colour section or, Colour photographs to the Monochrome section will result in rejection of such photographs.

## COPYRIGHT
The original image(s) must have been taken using a photographic process and all entrants must have the sole copyright to each image they submit. Clip Art and Copyright Free material are not acceptable. The National Photographic Art Society of Sri Lanka takes no responsibility for any legal issue arising on the copyright of published images of the entrants.

## IMAGE TITLES
Image titles should be a maximum of 25 characters including spaces. All images must have a unique title. Words such as “Untitled” and “No Title” will not be accepted. Photographs submitted to the Nature section should not have "cute titles" but should have descriptive titles that properly identify the subject. Images without an acceptable title will not be judged.

## FILE NAMING
Files should be renamed as follows:

| |
|---|
| **Section-Entrant’s Name-Image Title.jpg** |

**Example:** Section : **Open Colour**, Entrant’s Name : **Pasan Silva**, Image Title : **Fate**
File name should be :

| |
|---|
| **Open Colour-Pasan Silva-Fate.jpg** |

The titles should appear on the entry form as they are to appear in the Catalogue.

## NAMES AND WATERMARKS

No information about the entrant will be given to the selectors. An image showing the name of the entrant on screen as a watermark or other means will be made disqualified.

## IMAGE SIZE

All images must be submitted in JPEG format. Maximum Horizontal Dimension is **1920 Pixels** and the Maximum Vertical Dimension is **1080 Pixels** (including any borders) at **300 p.p.i.**
Please Note : portrait/vertical format images should be no larger than 1080 pixels high.
Smaller images are acceptable but will be projected smaller on the screen.
Image file sizes should **not be larger than 2 MB.**
The projection background is black. DO NOT fill empty space with/or add large borders. Any borders should be no greater than 2 pixels wide and should be incorporated within the 1920x 1080 pixels image size.
Entrants who wish to submit photographs to the "Mobile Phone (Open)" category, should keep the meta data of the image.

## COLOUR SPACE

The judging and Display software operates in and assumes that the images are in **sRGB** colour space. Images will be displayed on a projector using the **sRGB** colour space. The projector only displays colours which are visible in **sRGB**.

## SUBMISSION VIA GOOGLE FORM

Properly renamed image files should be sent by Google Form Through our Website **www.npassrilanka.org**

## COMPLIANCE

The organizers before, during or after the Salon, may turn down any image or entry application at their discretion. An image or entry application may be declined if it does not conform to the published Conditions of Entry or Definitions (see below) or if that image or entry application is deemed unsuitable. In order to ensure that images comply with the Conditions of Entry and Definitions, the organizers may carry out checks on images to make sure that:
1. The images are the original work of the entrant,
2. The images comply with the rules and definitions as set out in the entry conditions.

This may involve the entrant being asked to provide the original image(s). In the event of any submitted image being found to be against the published Conditions of Entry or Definitions, or not to be wholly the work of the entrant, that entrant's entire entry may be rejected. An entrant failing to provide a requested image file may, at the organizers' discretion, be considered to be in contravention of the above conditions and may also have their entry declined.

The decision of the organizers and judges to accept an application and entries will be final. Violations and observed violations of the Conditions of Entry will be reported to the relevant accreditation bodies and may result in a declination of the entrant's application to have his/her images included in the above and other exhibitions.

## DISQUALIFICATION NORMS

• Monochrome Images may not be entered in Amateur Colour or Open Colour Sections
• Colour Images may not be entered in Amateur Monochrome or Open Monochrome Sections
• Images which do not adhere to a section's definition shall be liable to disqualification.

## NOTIFICATIONS

Notification of results will be sent by email. Contestants should ensure that they provide an active email address and that spam filters are set to accept emails from **npasexhibitions@gmail.com**. Notifications will not be sent by post.

## EXHIBITION CATALOGUE

Entrants can download the PDF Exhibition Catalogue from The National Photographic Art Societyof Sri Lanka website http://npassrilanka.org/ after 13th July 2024.

## REPRODUCTIONS

By submitting an entry for the 45th National Competition and Exhibition of Photography 2024- Sri Lanka, the entrant permits the organizers to reproduce all or part of the entered material free of charge for publication in a catalogue, in an internet site and/or in other media related to the above Salon.

## AWARDS

| | **NPAS GOLD MEDAL** | **NPAS SILVER MEDAL** | **NPAS BRONZE MEDAL** | **NPAS MERIT AWARDS** |
|---|---|---|---|---|
| AMATEUR COLOUR | 1 | 1 | 1 | 8 |
| AMATEUR MONOCHROME | 1 | 1 | 1 | 8 |
| OPEN COLOUR | 1 | 1 | 1 | 8 |
| OPEN MONOCHROME | 1 | 1 | 1 | 8 |
| TRAVEL (OPEN) | 1 | 1 | 1 | 8 |
| NATURE & WILDLIFE (OPEN) | 1 | 1 | 1 | 8 |
| MOBILE PHONE (OPEN) | 1 | 1 | 1 | 5 |
| **BEST MONOCHROME PORTRAIT - L.E. SAMARARATHNA CHALLENGE TROPHY** | | | | |
| **BEST AOUTHOR OF THE COMPETITION - HENRY RAJAKARUNA CHALLENGE TROPHY** | | | | |

## JURY

| | |
|---|---|
| AMATEUR COLOUR / AMATEUR MONOCHROME | Mr. Sanka Sammana<br>*EFIAP,GPU CR 2,GPU Aphrodite, LPSS, GAPU, FNAPSL, ANPAS,AISLP, Creative PHOTO-ARTIST*<br>Mr. Gagan Karunachandra<br>*AFIAP, ANPAS*<br>Mr. Ashain Marasinghe<br>*EFIAP/b, GPU-CR02, cMOL* |
| OPEN COLOUR / OPEN MONOCHROME | Mr. Sanka Sammana<br>*EFIAP,GPU CR 2,GPU Aphrodite, LPSS, GAPU, FNAPSL, ANPAS,AISLP, Creative PHOTO-ARTIST*<br>Mr. Mithra S. Weerakone<br>*Hon. FNPAS, ANPAS, LISLP*<br>Mr. Athula Ranaraja<br>*Dip. in Photography-NPAS, Dip. in Photography-Uni. of Kelaniya, Hon. FNPAS, LISLP* |
| TRAVEL (OPEN) / MOBILE PHONE PHOTOGRAPHHY (OPEN) | Mr. Sanka Sammana<br>*EFIAP,GPU CR 2,GPU Aphrodite, LPSS, GAPU, FNAPSL, ANPAS,AISLP, Creative PHOTO-ARTIST*<br>Mr. Athula Ranaraja<br>*Dip. in Photography-NPAS, Dip. in Photography-Uni. of Kelaniya, Hon. FNPAS, LISLP*<br>Mr. Priyantha Bandara<br>*Professional Landscape, Architectural & Commercial Photographer / Instructor* |
| NATURE & WILDLIFE (OPEN) | Dr. Lalith Ekanayaka<br>*EFIAP*<br>Mr. Laksitha Karunarathna<br>*FRPS*<br>Mr. Ashain Marasinghe<br>*EFIAP/b, GPU-CR02, cMOL* |

## *Monochrome Definitions*

A black and white work fitting from the very dark grey (black) to the very clear grey (white) is a Monochrome work with the various shades of grey. A black and white work toned entirely in a single colour will remain a Monochrome work able to stand in the black and white category; such a work can be reproduced in black and white in the catalogue of a salon under FIAP Patronage. On the other hand a black and white work modified by a partial toning or by the addition of one colour becomes a colour work (polychrome) to stand in the colour category; such a work requires colour reproduction in the catalogue of a salon under FIAP Patronage.

## *Nature Definition*

Nature photography is restricted to the use of the photographic process to depict all branches of natural history, except anthropology and archaeology, in such a fashion that a well-informed person will be able to identify the subject material and certify its honest presentation. The story telling value of a photograph must be weighed more than the pictorial quality while maintaining high technical quality. Human elements shall not be present, except where those human elements are integral parts of the nature story such as nature subjects, like barn owls or storks, adapted to an environment modified by humans, or where those human elements are in situations depicting natural forces, like hurricanes or tidal waves. Scientific bands, scientific tags or radio collars on wild animals are permissible. Photographs of human created hybrid plants, cultivated plants, feral animals, domestic animals, or mounted specimens are ineligible, as is any form of manipulation that alters the truth of the photographic statement.

No techniques that add, relocate, replace, or remove pictorial elements except by cropping are permitted. Techniques that enhance the presentation of the photograph without changing the nature story or the pictorial content, or without altering the content of the original scene, are permitted including HDR, focus stacking and dodging/burning. Techniques that remove elements added by the camera, such as dust spots, digital noise, and film scratches, are allowed. Stitched images are not permitted. All allowed adjustments must appear natural. Color images can be converted to grey-scale monochrome. Infrared images, either direct-captures or derivations, are not allowed.

Images used in Nature Photography competitions may be divided in two classes: Nature and Wildlife. Images entered in Nature sections meeting the Nature Photography Definition above can have landscapes, geologic formations, weather phenomena, and extant organisms as the primary subject matter. This includes images taken with the subjects in controlled conditions, such as zoos, game farms, botanical gardens, aquariums and any enclosure where the subjects are totally dependent on man for food.

## *Photo Travel Definition*

A Photo Travel image expresses the characteristic features or culture of a land as they are found naturally. There are no geographical limitations. Images from events or activities arranged specifically for photography, or of subjects directed or hired for photography are not appropriate, close up pictures of people or objects must include features that provide information about the environment.

Techniques that add, relocate, replace or remove any element of the original image, except by cropping, are not permitted. The only allowable adjustments are removal of dust or digital noise, restoration of the appearance of the original scene, and complete conversion to grayscale monochrome. Other derivations, including infrared, are not permitted. All images must look natural.

## USE OF ARTIFICIAL INTELLIGENCE (AI)

Entrants who submit images which are created with Artificial Intelligence (AI) will be disqualified from the entire competition.

## RAW FILES

All Entrants must submit RAW files of their images which have been submitted for Nature & Wildlife (Open) / Travel (Open) sections via "**wetrasfer**" or "**Google Drive**" to **npasexhibitions@gmail.com** before **14th June 2024.** Entrants who wish to submit photographs to the "Mobile Phone (Open)" category, should keep the meta data of the image. **Those who fail to send their RAW files will be disqualified from the competition.**

## ENTRY FEES

| AMATEUR SECTIONS | |
|---|---|
| Any One Amateur Section | Rs. 400/- |

• Amateur Entrants must submit a copy of their Educational Institute ID card / Membership Card along with the Google Application. School Entrants must submit a certification letter signed by the Class Teacher with the school seal along with the Google Application.
• Each School can submit Photographs as group of entries. Submissions must send via a "wetransfer" link or a "Google Drive" Link to npasexhibitions@gmail.com along with a letter fromthe Teacher in Charge. Entries will be judged individually.

| OPEN SECTIONS | |
|---|---|
| Any One Open Section | Rs. 500/- |

## PAYMENT OF ENTRY FEES

Pay Entry Fees to the following Bank Account

| | |
|---|---|
| **Account Type** | **Currant Account** |
| **Account No.** | **000460002133** |
| **Account Name** | **The National Photographic Art Society of Sri Lanka** |
| **Bank** | **Sampath Bank PLC.** |
| **Branch** | **Borella, Colombo 08.** |

Please attach bank receipt/ paying in slip to the Google Application form. It is necessary to mention the entrant's name (as appearing in the entry form) and the purpose of payment as 'Entry fee for the 45th Exhibition' in the bank receipt/ paying in slip.

The organizers regret that entries for which no fee is received will not be judged. Submitting of entries will comply that the entrant is bound to the above rules & regulations.

## INQUIRIES

Those who want to make any email enquiries please write to the Director Exhibition: npasexhibitions@gmail.com

## VERY IMPORTANT

All communication will be made from **npasexhibitions@gmail.com**. Please ensure that spam filters are set to accept emails from this ID.

Sameera Kotelawala
EFIAP, ANPAS
Director Exhibition
The National Photographic Art Society of Sri Lanka.
0772 55 55 54
npasexhibitions@gmail.com
www.npassrilanka.org